**02-10-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ලෝකයේ ඇති මිහිරිතම වචනය නම් “බාබා” යන්නයි. බාබා යන වචනය නිරන්තරයෙන්ම ඔබගේ දෙතොලින් මතු විය යුතුයි. දිගින් දිගටම ශිව බාබාගේ හැඳින්වීම සියලු දෙනාටම ලබා දෙන්න.

**ප්‍රශ්නය:** සත් යුගයේදී මිනිසුන් පමණක් නොව සතුන් පවා ලෙඩ වන්නේ නැහැ. ඇයි ඒ?

**පිළිතුර:** සෑම ලෙඩක් දුකක්ම ලොවින් තුරන් කර හැරීමේ මහා ලොකු ශල්‍යකර්මයක් බාබා විසින් මෙම සංගම යුගයේදී කරනා නිසා තමයි එසේ වන්නේ. පරමාත්ම පියා තමයි සදාතනික ශල්‍ය වෛද්‍යවරයා වන්නේ. දැන් ඇති ලෝකය සම්පූර්ණයෙන්ම ලෙඩින් දුකින් පිරිලා. ඒ කාලයේදී කිසිම ආකාරයක දුකක නාමයක්වත් ඉතිරි වන්නේ නැහැ. මෙම ලෝකයේ දුකින් මිදීම සඳහා ඔබ ඉතාමත් ධෛර්යවන්ත විය යුතුයි.

**ගීතය:** ඔබ ලබා ගැනීමෙන් අප සියලු දෙය ලබා ගතිමු. මුළු පොළෝ තලයත් අහස් ගැබත් අයිති අපටයි.

ඕම් ශාන්ති. ඔබට එය දෙවතාවක් වුවත් කිව හැකියි. -ඩබල් ඕම් ශාන්ති - ජීවය තමාගේම හැඳින්වීම ලබා දෙනවා: ජීවය වන මම සාමයේ ප්‍රතිමූර්තියක්. මම ඉන්නා තැන සාම දේශය වන අතර අපි බාබා ගේ දරුවෝ වෙමු. සියළුම ජීව ඕම් කියා කියනවා. එහිදී අප සියළු දෙනාම සහෝදරයන් වන අතර මෙම ලොවට පැමිණි කල සහෝදර සහෝදරියන් වෙමු. සහෝදරයන් හා සහෝදරියන් අතර සම්බන්ධතාවය පටන් ගන්නවා. පියා පැහැදිලි කර දෙනවා: ඔබ සියළු දෙනාම මගේ දරුවන් ඔබත් බ්‍රහ්මාගේ දරුවන්. එමනිසා, ඔබ සහෝදර සහෝදරියන් බවට පත් වෙනවා.වෙන කිසිම සම්බන්ධතාවයක් ඔබට නැහැ. ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් බ්‍රහ්ම කුමාරයින් හා කුමාරියන් බවට පත් වෙනවා.ඔහු මෙම පැරණි ලෝකය වෙනස් කිරීම සඳහා මෙම වේලාවේදී පමණක් පැමිණෙනවා. බ්‍රහ්මාගේ මාර්ගයෙන් පමණයි පියා නව ලෝකය නිර්මාණය කරන්නේ. ඔබටත් බ්‍රහ්මා සමග සම්බන්ධතාවයක් තිබෙනවා නේද? මෙම ක්‍රමය ඉතාමත් හොඳයි. ඔබ සියළු දෙනාම බ්‍රහ්ම කුමාරයින් හා කුමාරියන් වෙනවා. තමා ජීවයක් වශයෙන් සලකා පියාව සිහිපත් කරන්න. ඒත් සමගම ඔබ සියළු දෙනාම සහෝදර සහෝදරියන් බවද සලකන්න. කිසිම ආකාරයක දූෂිත ඇසක් නොතිබිය යුතුයි. මෙහි කුමාරයින් හා කුමාරියන් වැඩිමහල් වෙන විට එකිනෙකා අතර දූෂිත ඇස් වැවෙන්න පටන් ගෙන දූෂිත දේ කරන්න පටන් ගන්නවා. දූෂිත දේ කරන්නේ රාවන්ගේ රාජ්‍යයේදී පමණයි. සත්යුගයේදී කිසිම දූෂිත දෙයක් සිදුවන්නේ නැහැ. දූෂිත යන වචනයවත් එතැනට එන්නේ නැහැ.මෙහි දූෂත දේ රාශියක් සිදු වෙනවා. ඒ සඳහා උසාවිත් තිබෙනවා. එහි නම් කිසිම ආකාරයක උසාවියක් කිසිම දෙයක් නැහැ. එහි සිර ගෙවල්, පොලිසි, හොරු කිසිම කෙනෙක් නැති එකම හරිම පුදුමයක්. දුක ගෙන දෙන මේ සියල්ල ඇති වන්නේ මෙහියි. දරුවනි, අන්න ඒ නිසා තමයි මෙය සතුටත්- දුකත් , ජයග්‍රහණයත්- පරාජයත් අතර සටනක් බව ඔබට කල්තියාම තේරුම් කර දී තිබෙන්නේ. ඔබ පමණයි මෙය තේරුම් ගන්නේ. මායා නිසා පරාජය වූ අය ඕනෑම දෙයක් නිසාත් පරාජය වෙන බව කියා තිබෙනවා. පියා පැමිණ කල්ප භාගයක් පුරාවටම මායාව ජය ගන්නා ආකාරය කියා දෙනවා. එවිට ඔබ කල්ප භාගයකට ජය ලබා තිබිය යුතුයි. මෙය අළුත් දෙයක් නොවෙයි. පැන්ස කිහිපයක පමණක් වටිනාකම ඇති සාමාන්‍ය ක්‍රීඩාවක් තමයි මෙය. එතැනින්, ඔබ මා සිහිපත් කර කල්ප භාගයකට වාසනාව දිනා ගන්නවා. රාවන්ගේ රාජ්‍යයේදී ඔබ මා අමතක කරනවා. භාරතයේ මිනිස්සු සෑම වසරකදීම පඹයෙක් සාදා එය පුළුස්සා දමන්නේ රාවන් නම් වූ සතුරාගෙයි. ඔවුන් එය කරන්නේත් භාරතයේ මිනිස්සු වැඩියෙන් ඉන්නා රටකයි. භාරතයේ මිනිසුන්ගේ ආගමික උත්සවයක් හැටියටයි ඔවුන් එය හඳුන්වන්නේ. ඔවුන් දශේරා (රාවන්ගේ පඹයෙක් සාදා පිළිස්සීම) සමරනවා. ඉතින්, එය සීමිතදෙයක් බව දරුවන්ට පැහැදිලි කර කියා දිය යුතුයි. ලංකාවේ පමණක් නොවෙයි මුළු ලෝකයේම දැන් රාවන්ගේ රාජ්‍යය පැතිරිලයි තිබෙන්නේ. ලෝකය ඉතාමත් විශාලයි නේද? මුළු ලොවම සාගරයේ පිහිටා තිබෙන බව පියා තේරුම් කර කියා දී තිබෙනවා. තම අඟින් ලෝකය දරා සිටිනා එළදෙනෙක් හෝ ගොනෙක් සිටිනවා. ඒ සතා වෙහෙසට පත් වුණු විට ලෝකය අනිත් අඟට මාරු කරනවා, කියා මිනිස්සු කියනවා. කොහොමනමුත් එහෙම දෙයක් ලෝකයේ නැහැ. මුළු ලෝකයම තිබෙන්නේ වතුර උඩ : ලෝකය වටේ සෑම තැනකම වතුර මිසක් වෙන කිසිම දෙයක් නැහැ. රාවන්ගේ රාජ්‍යය දැන් මුළු ලොවම වසා පැතිරී ගොස් තිබෙනවා. එමනිසා

රාමාගේ රාජ්‍යය නැතිනම් සත්‍යයේ රාජ්‍යය නිර්මාණය කිරීම සඳහා දැන් පියා පැමිණ සිටිනවා.ඊශ්වර (සත්‍යයේ දෙවියන්) ගැන කතා කරනා විට මිනිස්සු කියනවා ඔහු තමයි ඉහළම ඉහළ කෙනා. ඔහුට ඕනෑම දෙයක් කල හැකියි කියලා. එම ප්‍රශංසාව වැඩකට නැති දෙයක්. එතැනින් ඔහු කෙරෙහි වූ එපමණ සෙනෙහසක් පෙන්නුම් වන්නේ නැහැ. මෙතන දෙවියන් කියන්නේ පියාටයි. බාබා කියා කීම තුළින් උරුමය ලබා ගැනීමේ හැකියාවක් ලැබෙවා. ශිව බාබා කියනවා: ඔබ නිරන්තරයෙන්ම - බාබා. බාබා- කියා කිව යුතුයි ඊශ්වර හා ප්‍රභූ යන වචන අමතක කරන්න. බාබා කියනවා: නිරන්තරයෙන් මා සිහිපත් කරන්න. ප්‍රදර්ශන වලදී පැහැදිලි කර දෙන විට ශිව බාබාගේ හැඳින්වීම කිහිපවාරයකදීම හොඳින් කරන්න. ශිව බාබා පමණයි ඉහළම ඉහළ කෙනා වන්නේ. ඔහු සත්‍යයේ පියා වශයෙනුත් හැඳින්වෙනවා. මුස්ලිම් අය අල්ලා කියා උදේ පාන්දර මිනිත්තු දහයක් සිට කුරාණය කියවා, කියනවා: අල්ලා කියනවා: ඔබ කිසිම කෙනෙකුට දුකක් නොදිය යුතුයි. ඔබ මෙය නොකල යුතුයි. මෙය කිව්වේ බාබායි කියන එක ඔවුන්ට අමතක වෙලා. බාබා කියන වචනය තමයි මිහිරිම වචනය. ශිව බාබා, ශිව බාබා කියන වචන පිට වෙන්නේ මිනිසුන්ගේ කටින් පමණයි. එළදෙනෙකුගේ කටින් නොවේ. ඔබලා ශිව ශක්තීන්. ඥානයේ අමෘතය නෙළුම් පෙති වන්වූ ඔබගේ දෙතොලින් මතු වෙනවා. ඔබගේ නම ප්‍රසිද්ධ කරවීම සඳහා ඔවුන් ගවමුක්ත් (ගව මුඛය) ගැන සඳහන් කළා. ඔබ මෙය ගංගා වලට කියන්නේ නැහැ. නෙළුම් තොල් වලින් අමෘතය ගලා එන්නේ මේ කාලයේදීයි. ඥානයේ අමෘතය එක් වතාවක් පානය කළ කෙනෙක් නැවත වස පානය නොකල යුතුයි. අමෘතය පානය කිරීමෙන් තමයි ඔබලා දේවතාවරුන් වන්නේ. මම දැන් යක්ෂයින් දේවතාවරුන් බවට පත් කරවීම සඳහා පැමිණ සිටිමි. ඔබ දැන් දේවතාවරුන්ගේ කොටසක් බවට පත් වෙමින් සිටියි. සංගම යුගය එන්නේ කවදාද, කෙසේද කියන එක කිසිම කෙනෙක් දන්නේ නැහැ. බ්‍රහ්ම කුමායින් හා කුමාරියන් වන අපි මෙම උසස් සංගම යුගයට අයත් අය බව දැන් ඔබ දන්නවා. අනිත් සියළු දෙනාම කලි යුගයේ අයයි. මෙතන ඉන්නේ ඉතාමත් ටික දෙනයි. ගස පිළිබඳ ඥානය ඔබ තුළ තිබෙනවා. මුලදී එය කුඩාවට තිබුණත් දැන් වර්ධනය වෙනවා. උපත් පාලනය සඳහා ඔවුන් නොයෙක් පර්යේෂණ කරනවා. මිනිසුන්ට අවශ්‍ය වන්නේ එක දෙයක් කරන්නයි. නමුත් ඒ වෙනුවට වෙනත් දෙයක් සිදු වෙනවා. සියළු දෙනාම මිය යායුතුයි. ඔවුන් හිතනවා ඔවුන් ඉතාමත් හොඳ ඵලදාවක් ලබයි කියලා. කොහොමනමුත්, වැස්සෙන් පසු සෑහෙන විනාශයක් සිදු වෙනවා. ස්වාභාවික ව්‍යසන ගැන කිසිම කෙනෙක් තේරුම් ගන්නේ නැහැ. කිසිම දෙයක් සහතික නැහැ. අස්වැන්න ලබන කාලයේ ගල් වැසි සහිත කුණාටුවක් පැමිණියොත් මහා විනාශයක් සිදු වෙනවා. වැස්ස නැති වුණත් සිදු වන්නේ විනාශයක්. ඒවා තමයි ස්වභාවික ව්‍යසන කියන්නේ. එවන් දේ රාශියක් තිබිය හැකියි. එවන් දේ වලින් බේරී සිටීමට නම් ඔබ තුළ ලොකු ධෛර්යයක් තිබිය යුතුයි. කෙනෙක්ව ශල්‍යකර්මයකට භාජනය කරනවා බලන් ඉන්න බැරි කෙනෙක්ට සිහිය නැති වෙනවා. මෙම මුළු මහා ලෝකයම දැන් විශාල ශල්‍යකර්මයකට ලක් වෙන්නයි යන්නේ. පියා කියනවා: මම සියළු දෙනාටම ශල්‍යකර්මයක් කිරීම සඳහා පැමිණ සිටිනවා. මුළු ලොවම ලෙඩින් පීඩිත වෙලා. පියාවත් සදාතනික ශල්‍ය වෛද්‍යවරයා වශයෙන් හඳුන්වනවා. අනාගතයේ මෙම ලෝකයේ ජීවත් වන අය කිසිම ලෙඩක් දුකක් අත්නොවිඳින පරිද්දෙන් ඔහු දැන් මේ මුළු ලොවටම විශාල ශල්‍යකර්මයක් කරනවා. ඔහු එතරම් ලොකු ශල්‍ය වෛද්‍යවරයෙක්. ජීවයන්ගේත් අසීමිත ලෝකයේත් ශල්‍යකර්මය සිදු කරන්නේ ඔහුයි. එහිදී මානව ජීව පමණක් නොවෙයි සතුන් පවා ලෙඩ වන්නේ නැහැ. තමාගේ චරිතය කුමක්ද දරුවන්ගේ චරිතය කුමක්ද යන්න පියා තේරුම් කර දෙනවා. නිර්මානයේ මුල, මැද, අග වශයෙන් මෙය හඳුන්වනවා. ඔබ දැන් මෙය ලබනවා. පළමුවෙන්ම දරුවන් වන ඔබ තුළ මෙම සතුට තිබිය යුතුයි. අද සත්ගුරු දවසයි. ඔබ සෑමවිටම ඇත්ත කතා කල යුතුයි. ව්‍යාපාර වල පවා කියනවා: ඇත්ත කියන්න. රවටන්න එපා. ඒ වුණත් ඔවුන් හරිම ලෝභ වී ලොකු ලොකු ගණන් වලට වෙළඳාම් කරනවා. ඔවුන් කවදාවත් ඇත්ත කියන්නේ නැහැ. කියන්නේ බොරුම පමණයි. අන්න ඒ නිසා තමයි ඔවුන් සත්‍යය සිහිපත් කරන්නේ. සත්‍යයේ නාමය ඔබ සමඟම වේවා. කියා කියනවා. සත්‍ය වන බාබා පමණයි ජීව වන ඔබව නැවත ඔහු සමඟ ගෙන යන්නේ කියන දේ ඔබ දැන් තේරුම් ගන්නවා.ජීව වන ඔබ දැන් සත්‍යයේ ආශ්‍රයට පැමිණ සිටිනවා. එමනිසා ඔබ ඔහු සමඟ යයි. සත්‍යය වන ශිව බාබා දැන් පැමිණ සිටිනා බව දරුවන් වන ඔබලා දන්නවා. ඔහු ජීව වන අපව සදාකාලයටම පිරිසිදු කරවනවා. සත් යුගයේදී රාමාගේ නම හෝ සත්‍යයේ නම තමාට තිබෙනවා කියා ඔබ කියන්නේ නැහැ. පියා කියනවා: මම දැන් දරුවන් වන ඔබ වෙත පැමිණ සිටිනවා. මම ඔබව මගේ දෑස් මත තබා ගෙන නිවස වෙත ගෙන යමි. ඒ කියන්නේ මේ ඇස් නොවෙයි නමුත් තෙවෙනි ඇසයි. ඔබව නිවස කරා ගෙන යාම සඳහා පියා පැමිණ සිටිනා බව ඔබ දන්නවා. එය ශංකර්ගේ පෙරහැර නොවෙයි: එය ශිවාගේ දරුවන්ගේ පෙරහැරයි. ඔහු සියළුම ස්වාමීන්ගේත් ස්වාමියා වෙනවා. ඔහු කියනවා: ඔබ සියළු දෙනාම මනමාලියන් වන අතර මම මනමාලයා වෙමි. ඔබ සියළු දෙනාම ආදරවන්තියන්

වන අතර මම ආදරවන්තයා වෙමි. ආදරවන්තයා වන මට කල්ප බාගයක් පුරාවටම ඔබ ආදරවන්තියන් බවට පත් වී සිටියා. දැන් මම පැමිණ සිටිනවා. ඔබ සියළු දෙනාම භක්ති වන්තයින්: සියළුම භක්තිවන්තයින්ව ආරක්ෂා කරන්නේ සත්‍යයයි. ජීව ශරීරයක් මඟින් වන්දනා කරනවා.සත් යුගයේදී හා රිදී යුගයේදී භක්ති සිදු වන්නේ නැහැ. භක්තියේ ඵලය ඔබට ලබා දී තිබෙනා අතර එහි ප්‍රතිලාභය ඔබ සත් යුගයේදී අත්විඳිනු ඇත. ඔහු ඔබගේ ආදරවන්තයායි. ඔහු ඔබව නිවස කරා ගෙන යයි. එතනින් ඔබ දරණ උත්සාහයේ හැටියට ඔබ ඔබගේ රාජ්‍යය නම් වූ වාසනාව දිනා ගනියි. අමරණීයත්වයේ කතාව ශංකර් පාර්වතීට කිව්වා කියා ඔවුන් කියනවා. ඔබ සියළු දෙනාම පාර්වතීන්. අමරණීයත්වයේ කතාව ඔබට කියා දෙන මම අමරණීයත්වයේ දෙව ඝනයි. එකම එක කෙනාවයි එම නමින් හඳුන්වන්නේ. පියා ඉහළම ඉහළ කෙනා වෙයි. ඔහුට ඔහුගේම කියා ශරීරයක් නැහැ. ඔහු කියනවා: අමරණීයත්වයේ දෙවඝන වන මම ඔබට අමරණීයත්වයේ කතාන්දරය කියා දෙමි. ශංකර් හා පාර්වතී මෙතනට එන්නේ කොහොමද? ඔවුන් ඉන්නේ සූක්ෂම කලාපයේ. සූර්යයාගේ හෝ චන්ද්‍රයාගේ කිසිම ආලෝකයක් එහි නැහැ. සත්‍යය වූ පියා දැන් ඔබට සත්‍ය කතාව කියා දෙයි. පියා හැර වෙන කිසිම කෙනෙක්ට මෙම කතාව කියා දෙන්න බැහැ. විනාශයක් සිදු වන්න කාලය ගත වන බව ඔබත් තේරුම් ගන්නවා. ලෝකය ඉතා විශාලයි. ගොඩනැගිලි රාශියක් කඩා වැටී විනාශ වෙයි. භූමි කම්පා මඟින් ලොකු විනාශ සිදු වෙයි. බොහෝ අය මිය යයි. එවිට ඔබගේ කුඩා ගස පමණක් ඉතිරි වී දිල්ලිය පරිස්ථාන් (සුරංගනාවියන්ගේ භූමිය) බවට පත් වෙයි. පරිස්ථාන් වල තිබෙන්නේ ලක්ෂ්මී හා නාරායන්ගේ රාජ්‍යය පමණයි. එවන් ලොකු මාළිගා එහිදී සෑදෙයි. ඔබ අසීමිත උරුමයක් ලබයි. කිසිම වියදමක් දරන්න අවශ්‍ය නැහැ. බාබා කියනවා: මෙයාගේ (බ්‍රහ්මාගේ) කාලයේ සහල් ඉතාමත් ලාභයි. ඉතින් හිතන්න සත් යුගයේදී එය කොපමණ දුරට ලාභ වෙයි ද කියලා. සෑම කෙනෙකුගේ නිවසක්ම හා ඉඩමක්ම දිල්ලිය මෙන් විශාලව තිබෙයි. පැණි රස වතුර ලබා දෙන ගංගා අසබඩ ඔබගේ රාජ්‍යය බිහි වෙයි. ඔබ සෑම කෙනෙකුටම නැති වන්නේ කුමක්ද? ඔබට සෑම විටම කන්න ලැබෙයි. කොපමණ ලොකු ළළවළු පළතුරු තියෙනවාද කියා ඔබ දැක තිබෙනවා. ඔබ එහි ගොස් අමෘතය පානය කර නැවත පැමිණියා. එහි උයන් පාලකයකුත් සිටියා කියා ඔවුන් කිව්වා. ඔහු අනිවාර්යයෙන්ම ඉතා සැප ඇති තැනක හෝ ගංභාවක් අසබඩ සිටීවි. එහි සිටින්නේ ඉතා කුඩා ජනගහනයක්. දැන් බිලියන ගණන් මිනිස්සු ඉන්නවා. කොහොමනමුත් 900, 000 පමණක් සිටින අතර සියල්ල ඔබට අයිතිව තිබේවි. කිසිම කෙනෙකුට අපෙන් එය උදුරා ගත නොහැකි වන විදියේ ලොකු රාජ්‍යයක් පියා අපට ලබා දෙනවා. පොළොවේ හා අහසේ පාලකයින් බවට ඔබ පත්ව සිටිනවා. දරුවන් වන ඔබත් ගීතය ඇසුවා. එලෙස අසන විට සතුට තව තවත් වැඩි කරවන ලෙස සැදුණු ගීත 6 ක් 8 ක්ම තිබෙනවා. තමන්ගේ මනස එතරම් හොඳ නැහැයි කියා දැනෙන විට එම ගීතයක් දමා අසන්න. ඒවා සතුටේ ගීතයි. ඔවුන් ඒවායේ තේරුමත් දන්නවා. තමාව උද්යෝගිමත්ව තබා ගන්නා ආකාරය බාබා ඔබට පෙන්වා දී තිබෙනවා. තමන් එපමණ සතුටක් අත් නොදකින බව හෝ මායාගේ කුණාටු වලට හසු වන බව කියා ඇතැම් අය බාබාට ලියනවා. ඕ මායාගේ කුණාටුවක් එන විටම ඔබගේ හාමෝනියම් එක වාදනය කරන්න. ඔවුන් මහ පාරවල් වල ලොකු හාමෝනියම් වාදනය කරමින් පන්සල් වෙත යනවා. මිනිසුන්ව සතුටු කරවීම සඳහා. බොම්බේ වල මහාබග් (බොම්බේ වල ඇති උයනක්) හි ලක්ෂ්මී නාරායන් කොවිලේ මිනිස්සු නිතරම හාමෝනියම් එකක් වාදනය කරමින් ඉන්නවා. ඔබ මේ සිනමා ගීත වාදනය කරන්නේ ඇයි කියලා මිනිස්සු ඔබෙන් අහයි.නාටකයේ හැටියට මේ සියළු දේ අපටත් වැදගත් වෙනවා කියා ඔවුන්ට තේරුම් ගන්න බැහැ. දරුවන් වන ඔබ පමණයි එය තේරුම් ගන්නේ. ඒවාට ඇහුම්කන් දීමෙන් ඔබ සතුටට පත් වෙනවා. කොහොමනමුත් ඇතැම් දරුවන් ඒවා අමතක කරනවා. ගෙදර දී දුකින් ඉන්නා විට ඒවාට ඇහුම්කන් දී සතුටු වන්න. මේවා ඉතාමත් වටිනා දේවල්. කෙනෙකුගේ ගෙදරක නිතරම රණ්ඩුසරුවල් ඇති වෙනවා නම් ඔවුන්ට කියන්න: සත්‍යය පියා කියනවා: රාගය තමයි ලොකුම සතුරා. මෙය ජය ගැනීම තුලින් ඔබ මුළු ලොවම ජය ගන්නවා ඇති. එවිට මල් වැසි හා ජයග්‍රහණයේ සතුටු කඳුළු දැකිය හැකි වේවි. රත්තරන් මල් වැසි වැටේවි. ඔබ දැන් කටු තත්ත්වයේ සිට රත්තරන් මල් බවට පත් වෙනවා. එතනින් ඔබ මතු වෙනවා.මල් වැටෙනවා නොවෙයි ඇත්තටම ඔබ මල් මෙන් මෙලොවට පහල වෙනවා. රත්රන් මල් වැසි වැටෙයි කියා මිනිස්සු හිතනවා. කුමාරයෙක් පිටරටකට ගොස් උත්සවයක් පැවැත්වූ වෙලාවේ රත්තරන් වලින් සෑදූ මල් ජාති හැදුවා. මේවා සියළු දෙනාටම ඉස්සා. ඔහුගේ සතුට නිසා ඔහු බොහෝ හොඳින් ආගන්තුක සත්කාර කළා. ඔහු ඒවා සෑදුවේ රත්තරන් වලින් බාබා ඔහුගේ තත්ත්වය හොඳින් දන්නවා. ඇත්තටම කියනවා නම් ඔබ එන්නෙත් මල් වගේ. රත්තරන් මල් වන ඔබලා ඉහළ සිට පහළට එනවා. ලෝක ස්වාධිපත්‍යය නම් ලොතරැයිය ඔබ දිනා ගන්නවා. මම මේක ඔබට ගෙනාවා කියා ලෞකික පියෙක් කියූ විට, ඔහුගේ දරුවන් බොහෝ සෙයින් සතුටට පත් වෙනවා. බාබා කියනවා: මම ඔබට සත් යුගය ගෙනත් තිබෙනවා. ඔබ එය පාලනය කරයි. එමනිසා ඔබ තුළ

ලොකු සතුටක් තිබිය යුතුයි. බාබා කෙනෙකුට පොඩි තෑග්ගක් දුන් විට ඔහු කිව්වා : බාබා ඔබ අපට ලෝකයේ අධිරාජ්‍යයම ලබා දෙනවා. ඒකත් සමඟ සන්සන්දනය කරන විට මේ තෑග්ග මොකක්ද? ඕ, නමුත් ශිව බාබාගෙන් ලද සිහිවටනයක් තමා ළඟ තිබෙන විට ඔබට ඉතාමත් පහසුවෙන් ඔහු සිහිපත් කර දස දහස් ගණනින් ලබාගත හැකි වේවි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සත්‍යයේ ආශ්‍රයත් සමඟ ඔබ නැවතත් නිවස බලා යා යුතුයි. එමනිසා, නිතරම සත්‍යවාදීව සිටින්න. කවදාවත් බොරු කියන්න එපා.
2. බ්‍රහ්ම බාබාගේ දරුවන් වන ඔබලා සහෝදර සහෝදරියන් වෙනවා. එමනිසා, ඔබ කිසිම ආකාරයක දූෂිත දෙයක් නොකළ යුතුයි. සහෝදරයින් හෝ සහෝදර සහෝදරියන් යන සම්බන්ධකම හැරෙන්න වෙන කිසිම සම්බන්ධකමක් නොතිබිය යුතුයි.

**වරදානය:** පෘථිවියේ සිට අභ්‍යවකාශයට යන අය ගැන විද්‍යාඥයන් සියල්ල දන්නා ආකාරයටම, ඔබ ත්‍රිකාලදර්ශී දරුවන්ට, ඔබගේ නිහඬතාවයෙන්, එනම්, ඔබගේ ස්මෘති බලයෙන්, ඔබගේම උසස් උත්සාහයන් සහ මනෝ ස්ථිතිය මෙන්ම අන් අයගේ උත්සාහයන් ගැන සියල්ල ඉතා පැහැදිලිව දැනගත හැකිය. දිව්‍ය බුද්ධියක් තිබීමෙන් සහ පිරිසිදු ස්මෘති සිතිවිලි තුළ ඔබව ස්ථාවර කර ගැනීමෙන්, ඔබට ත්‍රිකාලදර්ශී වීමේ ආශිර්වාදය ලැබේ. එවිට ඔබට ප්‍රායෝගික ස්වරූපයට ගෙන ඒම සඳහා නව සැලසුම් ස්වයංක්‍රීයව මතු වේ.

**පාඨය:** සියලු දෙනා සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න, එවිට ඔබට ස්වයංක්‍රීයව සියලු දෙනා ගේ සෙනෙහස දිගටම ලැබෙනු ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

කිසිවෙකුට සේවය කිරීමට අවස්ථාවක් නොමැති යැයි පැවසිය නොහැක. යමෙකුට කතා කිරීමට නොහැකි නම්, ඔහුට තම මනසින්, ඔහුගේ ආකල්පයෙන් සහ සතුටු මනෝ ස්ථිතියෙන් සේවය කළ හැකිය. ඔබේ සෞඛ්‍යය හොඳ නැති වුවද, නිවසේ අසුන්ගෙන සහයෝගයෙන් සිටින්න. ඔබේ මනසෙහි පිරිසිදු සිතිවිලි තොගයක් රැස් කර ගෙන සුබ පැතුම් වලින් පිරී සිටින්න.